සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



13569

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය ..........................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 10 | |
| 03 | 11 - 20 | |
| 04 | 21 - 27 | |
| 05 | 28 - 41 | |
| 06 | 42 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති / ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

උපදෙස්:

- ※ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතු ය.
- ※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **නිවැරදි** හෝ **වඩාත් ම ගැළපෙන** හෝ පිළිතුර තෝරා **ඊට අදාළ අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

1. උඩරට නැටුම් කලාව සහ සිංහල නර්තන කලාව යන කෘති **දෙක** රචනා කරන ලද්දේ පිළිවෙළින්,
   (1) තිස්ස කාරියවසම් සහ සරත් විජේවර්ධන විසිනි.
   (2) තිස්ස කාරියවසම් සහ මුදියන්සේ දිසානායක විසිනි.
   (3) ජේ.ඊ. සේදරමන් සහ මුදියන්සේ දිසානායක විසිනි.
   (4) ජේ.ඊ. සේදරමන් සහ නිමල් වෙල්ගම විසිනි.
   (5) සරත් විජේවර්ධන සහ නිමල් වෙල්ගම විසිනි. (.........)

2. වෙස් ඇඳුම් කට්ටලයට අයත් කොටස් කිහිපයක් පමණක් නම් කර ඇති වරණය තෝරන්න.
   (1) සිබාබන්ධනය, බුබුළුපටිය, හස්තකඩය
   (2) සිබාබන්ධනය, බුබුළුපටිය, සිළුමිණ
   (3) අවුල්හැරය, උල්උඩය, සේලය
   (4) අවුල්හැරය, උල්උඩය, සිබාබන්ධනය
   (5) පායිම්පත, පච්චවඩම, සිබාබන්ධනය (.........)

3. සමාජීය වශයෙන් ඉපැරණි සන්නිවේදන අවස්ථා ලෙස සැලකෙන්නේ,
   (1) ස්තූප පූජා, අණබෙර සහ මහුල්බෙර වේ.
   (2) රණබෙර, අණබෙර සහ මහුල්බෙර වේ.
   (3) රණබෙර, හේවිසි සහ දළඳ පූජා වේ.
   (4) යහන්බෙර, හේවිසි සහ දළඳ පූජා වේ.
   (5) පෝයහේවිසි, හේවිසි සහ ස්තූප පූජා වේ. (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

4. තෙල්මේ නැටීම සහ වාහල නැටීම නර්තන දෙක දකිය හැකි වන්නේ,
(1) උඩරට ගම් මඩුවේ දී ය.
(2) පහතරට පහන් මඩුවේ දී ය.
(3) සබරගමු පහන් මඩුවේ දී ය.
(4) සබරගමු දෙවොල් මඩුවේ දී ය.
(5) පහතරට දෙවොල් මඩුවේ දී ය. (.........)

5. බලි ශාන්තිකර්මයට අයත් විශේෂ ගායනා ක්‍රම වන්නේ,
(1) මල් යහන්, තොරන් කවි, නළු ගී ය.
(2) මල් යහන්, තොරන් කවි, නෙළුම් කවි ය.
(3) ග්‍රහපංති, ඇඹුම් කවි, හිංහතරේ කවි ය.
(4) ග්‍රහපංති, ඇඹුම් කවි, උඩැක්කි කවි ය.
(5) ඇඹුම් කවි, පන්තේරු කවි, යාග කවි ය. (.........)

6. පහන් මඩු ශාන්තිකර්මයට **පමණක් ආවේණික** වූ නාට්‍යාමය පෙළපාළි වන්නේ,
(1) අසුර යක්කම සහ පොත්කඩේ යක්කමයි.
(2) අසුර යක්කම සහ දෙවොල්ගොඩ බැසීමයි.
(3) අඹ විදමන සහ දෙවොල්ගොඩ බැසීමයි.
(4) රාමා යක්කම සහ නයා යක්කමයි.
(5) රාමා යක්කම සහ මරා ඉපැද්දීමයි. (.........)

7. කොහොඹා කංකාරියේ කොහොඹා දෙවිවරුන් තිදෙනා හා සම්බන්ධ ප්‍රධාන දෙවිවරුන් ලෙස සැලකෙන්නේ,
(1) ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර හා දඩිමුණ්ඩ දෙවියන් ය.
(2) ඉරුගල් බණ්ඩාර, කන්දේ බණ්ඩාර හා වීරමුණ්ඩ දෙවියන් ය.
(3) සෙනරත් බණ්ඩාර, ගලේ බණ්ඩාර හා වීරමුණ්ඩ දෙවියන් ය.
(4) සෙනරත් බණ්ඩාර, වීරමුණ්ඩ හා දඩිමුණ්ඩ දෙවියන් ය.
(5) රුප්පා යකුන්, මෙලෙයි යකුන් හා දෙවොල් දෙවියන් ය. (.........)

8. සබරගමු සහ පහතරට නර්තන සම්ප්‍රදායවල ප්‍රවීණ නර්තන ශිල්පීන් ලෙස නම් කළ හැක්කේ,
(1) සිරිබෝහාමි සහ රද්දල්ලේ පොඩිමහත්තයා ය.
(2) සිරිබෝහාමි සහ ජී.වී. හීන්තිලමේ ය.
(3) සව්රිස් සිල්වා සහ ජී.වී. හීන්තිලමේ ය.
(4) සව්රිස් සිල්වා සහ කේ. ඇස්. ප්‍රනාන්දු ය.
(5) ජී.වී. හීන්තිලමේ සහ කේ. ඇස්. ප්‍රනාන්දු ය. (.........)

9. නර්තනයක, රංගවස්ත්‍ර නිර්මාණය කිරීමේ දී වඩාත් අවධානය යොමු කළ යුතු වන්නේ,
(1) වර්ණ, රේඛා, හැඩතල සහ මෝස්තර කෙරෙහි ය.
(2) වර්ණ, රේඛා, ආකෘති සහ මෝස්තර කෙරෙහි ය.
(3) වර්ණ, සැරසිලි, ආකෘති සහ පසුබිම කෙරෙහි ය.
(4) ආභරණ, සැරසිලි, ආකෘති සහ පසුබිම කෙරෙහි ය.
(5) ආභරණ, සැරසිලි, හැඩය සහ රූපය කෙරෙහි ය. (.........)

10. පහත ඡායාරූපවල දක්වෙන්නේ,




(1) වඩිග පටුන වේ.
(2) රීරි යකා වේ.
(3) පන්දම් පාළිය වේ.
(4) කරපිට කෝළම වේ.
(5) ගරා යකා වේ. (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

11. උඩරට නර්තන සම්ප්‍රදයට අයත් ආතත වාද්‍ය භාණ්ඩයක් හා එහි හඬ නිපදවීමට උපයෝගී කරගන්නා ආධාරකය වන්නේ,
(1) දවුල සහ කඩිප්පුවයි. (2) තම්මැට්ටම සහ කඩිප්පුවයි.
(3) රබාන සහ සවරම් පටියයි. (4) උඩැක්කිය සහ සවරම් පටියයි.
(5) යක්බෙරය සහ ගිගිරි වළල්ලයි. (.........)

12. සූනියම් කැපිල්ල සහ දහඅට සන්නිය යන යක් තොවිල්වල දැකිය හැකි නර්තන සහිත සංවාද අවස්ථා **දෙකක්** ඇත්තේ,
(1) නානුමුරය සහ කපුයක්කාරියේ ය.
(2) දෙවොල් ගොඩ බැසීම සහ පොත්කඩේ පාළියේ ය.
(3) වඩිහ පටුන සහ සළු පාළියේ ය.
(4) වඩිහ පටුන සහ අඹ විදමනේ ය.
(5) අඹ විදමන සහ රාම මැරීමේ ය. (.........)

13. පහතරට සම්ප්‍රදයයේ දෙවොල් මඩුව දෙළහ පෙළපාළියට අයත් අවසාන නාට්‍යමය අංග ලෙස රඟ මඬලට පිවිසෙන්නේ,
(1) ඇත් බන්ධනය සහ සේසත් පාළියයි.
(2) ඇත් බන්ධනය සහ චාමර පාළියයි.
(3) ඇත් බන්ධනය සහ මී බන්ධනයයි.
(4) මී බන්ධනය සහ මී කැඩීමයි.
(5) මී බන්ධනය සහ මරා ඉපැද්දවීමයි. (.........)

14. "විදෙන ලෙළෙන නරු බර පුළුලුකුල රැඳී . . " මෙම කාව්‍යය රචනා වූයේ කුමන යුගයක කවර සංදේශයක ද?
(1) කෝට්ටේ යුගයේ - සැවුල් සංදේශයේ ය.
(2) ගම්පළ යුගයේ - මයුර සංදේශයේ ය.
(3) ගම්පළ යුගයේ - තිසර සංදේශයේ ය.
(4) කෝට්ටේ යුගයේ - ගිරා සංදේශයේ ය.
(5) කෝට්ටේ යුගයේ - සැළලිහිණි සංදේශයේ ය. (.........)

15. දේශීය නර්තනයට සෘජුව ම සම්බන්ධ වන අවනද්ධ භාණ්ඩ වන්නේ,
(1) ගැටබෙරය, පහතරටබෙරය, දවුල සහ ඩැක්කිය වේ.
(2) ගැටබෙරය, පහතරටබෙරය, දවුල සහ උඩැක්කිය වේ.
(3) උඩරටබෙරය, දෙවොල්බෙරය, ඩැක්කිය සහ උඩැක්කිය වේ.
(4) උඩරටබෙරය, දෙවොල්බෙරය, දවුල සහ තම්මැට්ටම වේ.
(5) මඟුල්බෙරය, තවිල්බෙරය, උඩැක්කිය සහ තම්මැට්ටම වේ. (.........)

16. "අන්දර කැලේ දර ලීයේ කුරුම්බියා" මෙහි ඇති ලඝු හා ගුරු අක්ෂර ගණන,
(1) ලඝු 07 ගුරු 05 කි. (2) ලඝු 08 ගුරු 05 කි.
(3) ලඝු 08 ගුරු 04 කි. (4) ලඝු 09 ගුරු 05 කි.
(5) ලඝු 09 ගුරු 04 කි. (.........)

17. භරත නාට්‍යම් සංදර්ශනයක ඉදිරිපත් කරන නර්තනාංග පෙළෙහි නෘත්ත හා නෘත්‍ය ගණයට ගැනෙන්නේ,
(1) පදම් සහ තිල්ලානා ය. (2) ශබ්දම් සහ තිල්ලානා ය.
(3) ජතිස්වරම් සහ වර්ණම් ය. (4) ජතිස්වරම් සහ අලාරිප්පු ය.
(5) වර්ණම් සහ ශබ්දම් ය. (.........)

18. මනිපුරි නර්තනයේ දී රාධාගේ ඇඳුමේ සාය සහ හැට්ටය ලෙස නම් කර ඇත්තේ,
(1) රිසම්පුරිට් සහ කුමින් ය. (2) රිසම්පුරිට් සහ සැට්ටෙයි ය.
(3) චෝලිය සහ කුමින් ය. (4) කුමින් සහ ලෙහෙගා ය.
(5) කුමින් සහ රිසම්පුරිට් ය. (.........)

19. ආමද්, පරන්, තත්කාර්, සලාම් යන පාරිභාෂික වචන භාවිත වන්නේ,
(1) උත්තර භාරතීය කථකලී නර්තනයේ ය.
(2) දක්ෂිණ භාරතීය කථකලී නර්තනයේ ය.
(3) උත්තර භාරතීය මනිපුරි නර්තනයේ ය.
(4) උත්තර භාරතීය කථක් නර්තනයේ ය.
(5) දක්ෂිණ භාරතීය කථක් නර්තනයේ ය. (.........)

20. රබින්ද්‍රනාත් ටාගෝර්තුමා විසින් නිෂ්පාදනය කළ නෘත්‍ය නාටකයක් සහ එතුමා පිහිටුවන ලද කලායතනය,
(1) ශාප් මෝචන් සහ ශාන්ති නිකේතනයයි.
(2) ශාප් මෝචන් සහ කේරළ කලා මණ්ඩලයයි.
(3) කල්පනා සහ කේරළ කලා මණ්ඩලයයි.
(4) කල්පනා සහ කලා ක්ෂේත්‍රයයි.
(5) ජීවනයේ රිද්මය සහ ශාන්ති නිකේතනයයි.

[ හතරවෙනි පිටුව බලන්න.


13569

21. හින්දුස්ථානි සංගීතයේ ත්‍රිතාලය යනු,
(1) ˣධා ධි නා / ᴼධා තු නා /
(2) ᴼධා ධිං ධිං ධා / ˣධා ධිං ධිං ධා /
(3) ˣධා ධිං ධිං ධා / ²ධා ධිං ධිං ධා / ᴼධා තිං තිං තා / ³තා ධිං ධිං ධා /
(4) ˣධ ගෙ න ති / ᴼනී ක ධි න /
(5) ˣධි නා / ²ධි ධි නා / ᴼතී නා / ³ධි ධි නා / (.........)

22. චිත්‍රසේන ඩයස් විසින් විසිවන සියවසේ නිර්මාණය කළ මුද්‍රා නාට්‍ය අතුරෙන් වඩා ප්‍රසිද්ධියට පත් වූයේ,
(1) කුවේණි, නල දමයන්ති සහ කරදිය වේ.
(2) ශිවරංග, නල දමයන්ති සහ කරදිය වේ.
(3) ශිවරංග, මැක්බත් සහ කරදිය වේ.
(4) ගිනි හොරා, මැක්බත් සහ කිංකිණි කෝළම වේ.
(5) ගිනි හොරා, කිංකිණි කෝළම සහ කුඹී කතාව වේ. (.........)

23. කථකලි නර්තන සම්ප්‍රදාය ව්‍යාප්ත කිරීමට පුරෝගාමී වූවන් ලෙස සැලකෙන්නේ,
(1) වල්ලතෝල් නාරායනන් මෙනන්, මීනාක්ෂි සුන්දරම් පිල්ලෙයි සහ ගෝපිනාථ් ය.
(2) වල්ලතෝල් නාරායනන් මෙනන්, ෂම්බු මහරාජ් සහ ගෝපිනාථ් ය.
(3) උදය ශංකර්, ශිව ශංකර් සහ සුන්දර් ප්‍රසාද් ය.
(4) කුංජු කුරුප්, රාම්ගෝපාල් සහ ගෝපිනාථ් ය.
(5) කුංජු කුරුප්, උදය ශංකර් සහ සුන්දර් ප්‍රසාද් ය. (.........)

24. පහත සඳහන් මුද්‍රාවල, අසම්යුත හස්ත ලෙස සැලකෙන්නේ,



පතාක          කපෝත          ශිකර          පුෂ්පපුට

(1) පතාක සහ කපෝත මුද්‍රාවයි.
(2) පතාක සහ ශිකර මුද්‍රාවයි.
(3) කපෝත සහ ශිකර මුද්‍රාවයි.
(4) පුෂ්පපුට සහ ශිකර මුද්‍රාවයි.
(5) පුෂ්පපුට සහ කපෝත මුද්‍රාවයි. (.........)





25. ඉහත රූප දෙකෙහි ඇති රස පිළිවෙළින්,
(1) අද්භූත සහ ශෘංගාර රසය වේ.
(2) ක්‍රෝධය සහ ශෘංගාර රසය වේ.
(3) ක්‍රෝධය සහ ශාන්ත රසය වේ.
(4) භයානක සහ ශාන්ත රසය වේ.
(5) බිභත්ස සහ ශාන්ත රසය වේ. (.........)

● අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න.**

26. වන්නම්, හටන් කාව්‍යය, රාජ ස්තෝත්‍ර බිහිවූයේ මහනුවර යුගයේ ........................................ මඩුවේ දී ය.

27. මුරුගන් දෙවියන්ට භාර ඔප්පු කිරීමේ දී තවිල් බෙරය සහ නාගස්වරම් වාද්‍ය භාණ්ඩ වාදනය කරමින් ........................................ නැටුම ඉදිරිපත් කරයි.

[ පස්වෙනි පිටුව බලන්න.

28. සෞන්දර්ය අධ්‍යයන ආයතනය, ස්වාධීන ව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය බවට පත් වූයේ .................................. වර්ෂයේ දී ය.

29. "නිතිනි දන මන නයන පිනවන දුල් සිරින් දෙවහනක විලසා" මෙය .................................................. සවුදම වේ.

30. ශරීරයේ උපාංග කොටස් භාවිතයේ දී, හැඟීම් ඉස්මතු වන්නේ ...................................................... අභිනයේ දී ය.

31. රුක්මණී දේවි අරුන්ඩේල් වඩාත් ප්‍රසිද්ධියට පත් වූයේ දක්ෂිණ භාරතයේ .................................. නර්තනය සඳහා ය.

32. වේදිකාව සඳහා නර්තනයක් නිර්මාණය කිරීමේ දී එහි අවකාශයට අනුව නර්තනය රචනා කිරීම ................................................ නමින් හැඳින්වේ.

33. මනිපුරි නර්තනයට භාවිත කෙරෙන එක ම තත් භාණ්ඩය හඳුන්වන්නේ ..................................... ලෙස ය.

34. නරි බෑනා, කුකර්, හංසවිල, නිදි කුමරිය යන බටහිර බැලේ නාට්‍යවලට සංගීතය සැපයූ ප්‍රවීණ සංගීතඥයා වන්නේ ................................................ ය.

35. 'ගුරු බ්‍රහ්මා, ගුරු විෂ්ණු, ගුරු දේවෝ මහේෂ්වරා
ගුරු සාක්ෂාත් පර බ්‍රහ්මා තස්මෛ ශ්‍රී ගුරුවේ නමඃ'
මෙම ශ්ලෝකය ................................................ නමස්කාරයයි.

- අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

36. බලි ශාන්තිකර්මයේ දී බලි ඇදුරා අත දරන රංග භාණ්ඩ දෙක මොනවා ද?

1. ................................................ 2. ................................................



37. ඉහත රූපයේ ඇති චරිත **දෙක** නම් කරන්න.

1. ................................................ 2. ................................................

38. නාට්‍ය ශාස්ත්‍රය සහ අභිනය දර්පණය රචනා කළේ කවුරුන් ද?

1. ................................................ 2. ................................................

39. පහත නම් සඳහන් ප්‍රවීණ නර්තන ශිල්පිනිය හා ශිල්පියා ප්‍රසිද්ධියට පත් වූයේ කවර නර්තන සම්ප්‍රදයයන් සඳහා ද?

1. බාල සරස්වතී - ................................................

2. බිර්ජු මහරාජ් - ................................................

40. මහනුවර දළඳ පෙරහර සම්බන්ධයෙන් ඉටු කෙරෙන ප්‍රධාන චාරිත්‍ර විධි **දෙක** ලියන්න.

1. ආරම්භක චාරිත්‍රය - ................................................

2. අවසාන දින චාරිත්‍රය - ................................................

41. විදුලි ආලෝකයේ දී වර්ණ භාවිත කිරීමේ දී කොටස් දෙකකට වර්ග කෙරේ. ඒ මොනවා ද?


1. වර්ණය - ................................................

2. වර්ණය - ................................................

[ හයවෙනි පිටුව බලන්න.

42. පහත සඳහන් රූපවල දක්වෙන වෙස් මුහුණු නම් කරන්න.


A


B

A. ................................................ B. ................................................

43. කථක් නර්තනයට යොදා ගැනෙන ප්‍රධාන අවනද්ධ භාණ්ඩ **දෙක** මොනවා ද?

1. ................................................ 2. ................................................

44. කථකලි නර්තනයේ දී පහත සඳහන් පැළඳුම් භාවිත කෙරෙන්නේ කුමන ශරීරාංගවලට ද?

1. කිරීටම් - ................................................

2. විලංග - ................................................

45. අතීතයේ දී රංග භූමිවල රංගාලෝකය සඳහා භාවිත කර ඇති උපකරණ **දෙකකි.**

1. ................................................ 2. ................................................

46. "තුරු රත්න සිරි ලෙසිනා - තිළිණ නෙක දෙන නිත්‍ය සංතොසිනා"
මෙම ගායනය හා එහි තිත් රූපය කුමක් ද?

1. ................................................ 2. ................................................

47. සින්ඩරෙල්ලා, රෝමියෝ ජුලියට්, හංසවිල යන බැලේ නාට්‍ය අතුරෙන් වඩාත් ප්‍රසිද්ධියට පත් වූ නාට්‍යය හා සියවස ලියන්න.

1. නාට්‍යය - ................................ 2. සියවස - ................................

48. කර්ණාටක තාල පද්ධතියෙහි **මිශ්‍ර චාපු** සහ **තිශ්‍ර චාපු** යන්න සමාන වන දේශීය තාල **දෙක** ලියන්න.

1. මිශ්‍ර චාපු - ................................ 2. තිශ්‍ර චාපු - ................................

49. පහත සඳහන් නර්තන අන්තර්ගත වන්නේ කුමන භාරතීය සම්ප්‍රදායයන්ට ද?

1. තෝඩායම් - ................................................

2. බංගි අවච්බා - ................................................

50. විවිධ මල් වර්ග හා ගෙඩි වර්ග ඇති ලස්සන මල් වත්තකි. එය ආරක්ෂා කරන යෝධයා, ඊට ඇතුළු වන ළමයින් හා කුරුල්ලන් කෙරෙහි දැඩි **වෛරයෙන්** පසු වේ. මෙහි ඇති රසය හා භාවය ලියන්න.

1. රසය - ................................ 2. භාවය - ................................

***

The National e-Learning Portal for The General Education

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

13569



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

* **පළමුවන** කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II, III, IV කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම (i) කොටසට ලකුණු **06** ක් ද (ii) කොටසට ලකුණු **06** ක් ද (iii) කොටසට ලකුණු **08** ක් ද වශයෙන් මුළු ලකුණු **20** ක් බැගින් හිමි වේ.

## I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ ඉගෙන ගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

   'දෙංත තදෙම් තදෙම් රුදගජිං තකට ගත කුඳ ගත'

   'දෙං දෙං ගත ගත්දිත් තකු'

   'ජිං කිටිතත් තත් කිටිතක'

   (ii) පහත සඳහන් කවි පද මාත්‍රා තුනේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

   'සිරිවස ගෙන අසු නැගෙමින් තොලෙ සා
   සිරිබර ඉඹුලේ තුරු රැස නිවෙ සා'

   (iii) ප්‍රස්තාර කරන්න. (උඩරට/ පහතරට/ සබරගමු)

   උඩරට - කිරළා වන්නම, බෙර පදය, කවි පදයක් හා කස්තිරම

   පහතරට - නළුගීතිකා තාලය, බෙර පදය, කවි පදයක් හා ඉරට්ටිය

   සබරගමු - මණ්ඩුක වන්නම, බෙර පදය, කවි පදයක් හා කලාසම

2. ශාන්තිකර්ම ප්‍රධාන වශයෙන් ආගමික විශ්වාසයන් හා බැඳී පවතින්නේ සමාජයට යහපත් ආදර්ශයක් ලබා දීමේ අරමුණෙනි.

   (i) බෞද්ධාගමික වශයෙන් අයහපත් ක්‍රියාකලාපවල ප්‍රතිඵල සමාජයට ලබා දෙන ආකාරය සන්නියකුම ඇසුරෙන් සනාථ කරන්න.

   (ii) "කොහොඹා කංකාරිය වූ කලී දෙවියන් ප්‍රධාන කොට පූජාර්ථයෙන් ඉටු කෙරෙන ශාන්තිකර්ම ක්‍රියාවලියකි." එහි ගායනා, හත් පද උදහරණයට ගෙන ඉහත පාඨය විග්‍රහ කරන්න.

   (iii) දෙවොල් මඩුව / පහන් මඩුව ශාන්තිකර්මයේ දී පත්තිනි හා දෙවොල් රංගන අවස්ථාවල සුවිශේෂත්වය, රංගවස්ත්‍රාභරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

3. සාම්ප්‍රදායික භේරි වාදන ක්‍රමවල හා රංගවස්ත්‍රාභරණවල එකිනෙකට වෙනස් වූ අනන්‍යතා ලක්ෂණ මැනවින් ගැබ් වී ඇති බව ඒවා පිරික්සීමේ දී අනාවරණය වේ.

   (i) රාජ්‍ය පාලන තන්ත්‍රයේ අවශ්‍යතා අනුව සන්නිවේදනය සඳහා දේශීය වාද්‍ය භාණ්ඩ යොදා ගත් ආකාරය විස්තර කරන්න.

   (ii) වෙස් ඇඳුම් කට්ටලය / තෙල්මේ ඇඳුම් කට්ටලය / සබරගමු ප්‍රධාන ඇඳුම් කට්ටලය යන මේවායින් **එක්** ඇඳුම් කට්ටලයක කොටස් **තුනක්** ගෙන ඒවායේ විශේෂ අනන්‍යතා ලක්ෂණ පෙන්වා දෙන්න.

   (iii) වඩිග පටුන, රිද්දි බිසව, අඹ විදමන, සන්නි හා පාළි යන අංගවලින් **දෙකක්** තෝරාගෙන, ඒවායේ අංග රචනය හා රංගවස්ත්‍රවලින් හෙළිවන චරිත ලක්ෂණ පිරික්සන්න.

[ දෙවෙනි පිටුව බලන්න.

## II කොටස

4. දේශීය නර්තන කලාව විකාශනයේ දී එක් එක් යුගවලට විවිධ වූ සංස්කෘතික ලක්ෂණ බලපෑ බව මූලාශ්‍රය මගින් හෙළි වේ.
   (i) මහනුවර යුගයේ වන්නම් බිහිවීම පිළිබඳ සාහිත්‍යාගත තොරතුරු ඇසුරෙන් කරුණු දක්වන්න.
   (ii) පොළොන්නරු යුගයට බලපෑ දක්ෂිණ භාරතීය සංස්කෘතිය පිළිබඳ මූලාශ්‍රය **දෙකක්** ඉදිරිපත් කරන්න.
   (iii) ක්‍රි.ව. 1950-1970 දක්වා දේශීය නර්තන කලාවේ ප්‍රවර්ධනයට බලපෑ සාධක **හතරක්** දක්වන්න.

5. (i) "ගැමි නැටුම්වල ගායනා මගින් විදහා දැක්වෙන ගැමි ජීවන රටාව ප්‍රාදේශික ව විවිධත්වයක් ගනී." සනාථ කරන්න.
   (ii) සොකරි නාටකයේ චරිත **දෙකක්** ඇසුරෙන් බෙර පද හා කවිවලට චරිත නිරූපණය කෙරෙන ආකාරය සාකච්ඡා කරන්න.
   (iii) "මුදලි කෝළම හා ජස කෝළම ගත් කළ එම චරිත මගින් මානව සමාජ විවරණයක් ලබා දේ." විග්‍රහ කරන්න.

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි I, II, III යන කොටස්හි ප්‍රශ්නවලට වෙන වෙන ම පිළිතුරු සපයන්න.

| I කොටස | II කොටස | III කොටස |
|---|---|---|
| ගලීනා උලනෝවා | හංසවිල | මාරියස් පෙටීපා |
| ඇනා පාව්ලෝනා | නට් ක්‍රැකර් | වසලව් නිජින්ස්කි |
| ඉසඩෝරා ඩන්කන් | නිදි කුමරිය | ජීන් ජෝර්ජ් නෝවේර් |
| මාර්ත්‍රා ග්‍රැහැම් | පෙට්රුෂ්කා | මයිකල් ෆෝකයින් |

   (i) I **කොටස** - 'මිය ගිය හංසයා' නර්තනයට පණ පොවා වඩාත් ජනප්‍රිය වූ නර්තන ශිල්පිණිය කවු ද? ඇය පිළිබඳ ඇගයීමක් කරන්න.
   (ii) II **කොටස** - ක්‍රි.ව. 1877 දී රුසියාවේ නිෂ්පාදනය කළ ප්‍රකට බැලේ නාට්‍යය පිළිබඳ විග්‍රහයක් කරන්න.
   (iii) III **කොටස** - ප්‍රංශ ජාතිකයකු මෙන් ම බැලේ ආචාර්යවරයකු වූ මොහු ජාත්‍යන්තර නර්තන දිනය නිසා ම වඩාත් ප්‍රසිද්ධියට පත් විය. ඇගයීමක් කරන්න.

7. දීර්ඝ ඉතිහාසයක් ඇති භාරතීය නර්තන දඩි ලෙස ආගමික පසුබිමක් මත ගොඩනැඟුණකි.
   (i) ආගමික නර්තනය පසුව රාජ සභා නර්තනයක් ලෙසට පත් වූ ආකාරය පිළිබඳ ව **කථක්** නර්තනය ඇසුරෙන් කරුණු දක්වන්න.
   (ii) භරත නාට්‍යම්හි **පදම්** නර්තනය උදාහරණයට ගෙන ගීත ක්ෂේත්‍රයේ ප්‍රවීණ බැතිමතුන්ගේ දායකත්වය පිරික්සන්න.
   (iii) "මූලික අභ්‍යාස පමණක් නොව සතර අභිනය පිළිබඳ මනා පුහුණුවක් **කථකලී** නර්තන ශිල්පියාට අවශ්‍ය වේ." සනාථ කරන්න.

## IV කොටස

8. (i) ශ්‍රී ලාංකේය නර්තන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට දායක වූ ප්‍රවීණ ශිල්පීන් **දෙදෙනකු** පිළිබඳ ඇගයීමක් කරන්න.
   (ii) දේශීය ශාන්තිකර්මවල රංග භූමිය හා නූතන රංග භූමිය ගත් කල අද්‍යතනය, තාක්ෂණික මෙවලම් භාවිතයෙන් පොහොසත් ය. විමසන්න.
   (iii) වාණිජකරණය හමුවේ කාන්තා දායකත්වය ප්‍රබල වීම නර්තන ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට රුකුලක් වේ ද? පිරික්සන්න.

9. දේශීය නර්තන නිර්මාණකරණයට, පෙර-අපර දෙදිග නවීන තාක්ෂණය හා ශිල්ප ක්‍රමවලින් යුත් ප්‍රාසංගික කලාවක් අද්‍යතනයේ දකිය හැකි ය.
   (i) නර්තනවල ශිල්පි-ශිල්පිණියන්ගේ රංග වස්ත්‍රාභරණ හා වේශ නිරූපණවල නව්‍යකරණය ඉහත පාඨය ඇසුරෙන් සාකච්ඡා කරන්න.
   (ii) සංගීත ප්‍රසංගවල ගීත හා නර්තන සුසංයෝගයේ දී ඊට යොදා ගැනෙන සංචලන ඖචිත්‍යය විමසුමට ලක් කරන්න.
   (iii) රූපවාහිනී රියැලිටි (Reality) ප්‍රසංගවල නර්තන කණ්ඩායම් බිහි වීම හා තරඟකාරිත්වය, නව නර්තන කලාවේ ඉදිරි ගමන්මගට අත්වැලක් වේ ද? ඇගයීමක් කරන්න.

* * *